# විශ්වවිද්‍යාල ප්‍රවේශය
# (2023/2024 අධ්‍යයන වර්ෂය)

## විද්‍යාවේදී ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය ගෞරව  උපාධි පාඨමාලාව

**මාධ්‍යය: ඉංග්‍රීසි**

විද්‍යාවේදී ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය ගෞරව උපාධි පාඨමාලාවට අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන **යෝග්‍යතා පරීක්ෂණයට** අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම යෝග්‍යතා පරීක්ෂණය **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**, **ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**, හා **කැලණිය විශ්වවිද්‍යාලය** මගින් ඒකාබද්ධව පවත්වනු ලැබේ. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අපේක්ෂකයින් තම අභිමතය පරිදි ඉහත සඳහන් **ඕනෑම එක්** විශ්වවිද්‍යාලයක පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට අයදුම් කර පෙනී සිටිය යුතුය.

ප්‍රවේශය සඳහා සපුරාලියයුතු අවම සුදුසුකම්, අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය, අවශ්‍ය ලියකියවිලි සහ යෝග්‍යතා පරීක්ෂණයට අදාළ අනෙකුත් සියළු තොරතුරු පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**www.sjp.ac.lk (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)**

සියළුම අයදුම්කරුවන් <u>විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ඇති සබැඳිය (web link) ඔස්සේ මාර්ගගත ක්‍රමයට (online)</u> අයදුම්පත් යොමු කල යුතු අතර, **"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය"** යන නමින් **මහජන බැංකුවේ ගංගොඩවිල ශාඛාවේ** ගිණුම් අංක **097-1-001-7-001-4075** දරණ ගිණුමට බැර කරන ලද රු. **1650/=** ක තැන්පතුවේ ස්කෑන් පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් යොමු කළ හැකි අවසන් දිනය: **2024 ජුලි 30.**

යෝග්‍යතා පරීක්ෂණය **2024 අගෝස්තු 10 සහ 11** යන දිනවල පැවැත්වේ.

යෝග්‍යතා පරීක්ෂණ සංරචක පහත පරිදි වේ:

| **පරීක්ෂණය** | **පරීක්ෂණ ක්‍රියාපටිපාටිය** | **ලකුණු** |
|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂණ හයක් භාවිතයෙන් ඇගයීමට ලක්කෙරේ. | 60% |
| ක්‍රීඩා ජයග්‍රහණ | **2018 – 2024** කාලය තුළ අයදුම්කරුවන්ගේ ජාත්‍යන්තර, ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ කලාප මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ වලට අදාළ සහතික පත්‍ර පරීක්ෂා කිරීම මගින් ඇගයීමට ලක්කෙරේ. | 40% |

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ.
16/07/2024